*සැ. යු.* - මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2024 වර්ෂය සඳහා කොළඹ දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරිසභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,390 - 2024 ජුනි මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2024.06.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු .... ... ... | 550 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 555 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 555 |


### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 ජූලි 12 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 ජුනි 28 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## මොරටුව මහා නගර සභාව

### මොරටුව මහා නගර සභාවේ ගිනිහට තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම

මොරටුව මහා නගර සභාවේ ගිනිහට තනතුරුවල පවතින පුරප්පාඩු 08 ක් සඳහා සුදුසු පුද්ගලයන් තෝරා ගැනීමට පහත සුදුසුකම් ඇති තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙළ කරන ලද අයදුම්පත් **2024.07.05** දිනට හෝ ඊට පෙර නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මොරටුව යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරය වම්පස උඩ කෙළවරේ "ගිනිහට තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

**2. බඳවා ගැනීමේ සුදුසුකම් :**

2.1 අධ්‍යාපන සුදුසුකම් :

1. එකවරක දී සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය විෂයයන් හයකින් සමත් ව තිබිය යුතු අතර, එම අවස්ථාවේදී ම හෝ තවත් එක් අතිරේක අවස්ථාවක දී විද්‍යාව හා ඉංග්‍රීසි විෂයයන් ද සමත් ව තිබිය යුතුය.

2.2 කායික සුදුසුකම් :

(i) උස සෙ. මී. 162 කට නොඅඩු සහ ජෛව ස්කන්ධ දර්ශකය නියමිත පරිදි තිබිය යුතුය. (ජෛව ස්කන්ධ දර්ශකය 18.5 සිට 24 දක්වා විය යුතුය.)

(ii) සෑම අපේක්ෂකයෙකු ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(iii) දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන් - උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච රහිත ඇස් පෙනීම අවම වශයෙන් 6/6 සහ 6/12 අතර ද, වර්ණ පෙනීම ද සාමාන්‍ය විය යුතුය.

(iv) කෘත්‍රිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතුය. (උදා: පච්ච කොටා තිබීම වැනි)

2.3 වෙනත් සුදුසුකම් :

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ii) අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර තුනක් (3) අඛණ්ඩ ව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය තිබිය යුතුය.

(iii) අවිවාහක පිරිමි අයෙකු විය යුතුය.

(iv) යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර, නීති විරෝධී ක්‍රියාවන්ට සම්බන්ධ නොවූ අයෙකු බව පොලිස් වර්තාවකින් සනාථ කළ යුතුය.

(v) තනතුරට බඳවා ගැනීම සඳහා නියම කර ඇති සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට්* පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

2.4 වයස :

1. වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර 24ට නොවැඩි විය යුතුය.

**3. බඳවා ගැනීමේ ක්‍රමය :**

(i) නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයෙන් හා වෘත්තීය (ප්‍රායෝගික) පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සඳහා ආධුනික ගිනිහටයින් වශයෙන් තෝරා ගනු ලැබේ.

(ii) පුහුණුව ආරම්භ කිරීමට පෙර සියලුම ආධුනික ගිනිහටයින් කායික සහ මානසික යෝග්‍යතාවය තහවුරු කිරීම සඳහා වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.

(iii) පුරප්පාඩු සඳහා තෝරාගන්නා අයවලුන් එක් අවුරුදු ගිනිහට පුහුණු පාඨමාලාව හැදෑරිය යුතුය. පුහුණු කාලසීමාව තුළ දී වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායක නොවන හෝ අපේක්ෂිත රැකියා මට්ටමට ළඟා නොවන ආධුනික ගිනිහටයින් කිසිම වන්දියකින් තොරව පුහුණුවෙන් ඉවත් කරනු ලැබේ.

(iv) සාර්ථකව අදාළ පුහුණුව අවසන් කරන ආධුනික ගිනිහටයින් ගිනිහට තනතුර සඳහා ස්ථිරවම බඳවා ගනු ලැබේ. පුහුණු කාලසීමාව, ස්ථිර සේවා කාලය සඳහා ගණනය කරනු ලබන අතර, අදාළ වැටුප් පරිමාණයේ දෙවන පියවරේ තබනු ලැබේ.

(v) පුහුණු කාලසීමාව තුළ මාසිකව රු. 10,000 ක දීමනාවක් ගෙවනු ලැබේ.

(vi) පුහුණු කාල සීමාව තුළ දී කිසිම ආධුනික ගිනිහටයෙකුට විවාහ වීමට අවසර දෙනු නොලැබේ.

(vii) පුහුණුවට තෝරාගන්නා ලද ආධුනික ගිනිහටයින් ස්ථිර තනතුරට පත් කිරීමෙන් අනතුරුව පත් කළ දින සිට වසර 05ක කාලසීමාවක් අදාළ පළාත් පාලන ආයතනයේ සේවය කරන බවට පත්කිරීම් බලධාරියා සමග රු. 500,000 ක වටිනාකමින් යුතු බැඳුම්කරයක් පුහුණුව ආරම්භ කරන අවස්ථාවේ දී අත්සන් කළ යුතුය.

(viii) ආධුනිකයාගේ අභිමතය පරිදි පුහුණු කාලය තුළ පුහුණුවෙන් ඉවත් වන්නේ නම්, පුහුණුවට වැය වූ සියලුම වියදම් ආයතනය වෙත ගෙවීමට කටයුතු කළ යුතුය.

(ix) ගිනිහට තනතුර සඳහා පත්වීම ලැබූ පත්වීම්ලාභීන් අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ පදිංචි වන ලෙස නියම කළ හැකිය.

**4. වැටුප් කාණ්ඩය සහ පරිමාණය :**

වැටුප් කේත අංකය : RS1 – 2016

වැටුප් පරිමාණය : රු. 29,540 – 7x300 – 27 x 370 – රු. 41,630.

**5. ලිඛිත පරීක්ෂණය :**

I. බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි ගිනිහට තනතුර සඳහා බඳවා ගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණය පිළිබඳ විස්තර

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |

II. විභාගය සඳහා වන විෂයය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|
| සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය : | ජාතික කලාපීය හා ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුළ පවතින සමාජීය, සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක, දේශපාලනමය, ආර්ථික හා අනෙකුත් අදාළ සාධකයන් සම්බන්ධ ව මෙන් ම විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය සම්බන්ධයෙන් ඇති දැනුම, තර්කණ ශක්තිය, ගණිත කුසලතාවයන්, තාර්කික තීරණ ගැනීම හා කාලය කළමනාකරණය කිරීම, පරීක්ෂා කිරීම සඳහා සකස් වූ ප්‍රශ්න පත්‍රයකි. |

**වෘත්තීය පරීක්ෂණය :**

I. ලිඛිත පරීක්ෂණය සමත් අයදුම්කරුවන් පමණක් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

II. වෘත්තීය පරීක්ෂණයට සහභාගී වීමට පෙර අයදුම්කරුවන් තම ශාරීරික යෝග්‍යතාවය පිළිබඳ රජයේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුගෙන් ලබාගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

III. බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන් හි ගිනිභට තනතුර සඳහා බඳවා ගැනීම සඳහා වන වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර (ප්‍රායෝගික)

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *අවම සමත් ලකුණු* |
|---|---|---|---|
| **දරා ගැනීමේ හැකියාව** | අදාළ වන පරිදි | 60 | 36 |
| **සමබරතාවය** | අදාළ වන පරිදි | 40 | 24 |

IV. විභාගය සඳහා වන විෂයය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|
| දරා ගැනීමේ හැකියාව | (i) දිවීම<br>(කිලෝමීටර් 01 ක දුර දිවීමට ගතවන අවම කාලය අනුව ප්‍රමුඛතාවය)<br><br>(ii) ඩිප්ස් ගැසීම<br>(නිවැරදිව ඩිප්ස් 25 ක් ගැසීමට ගත වන අවම කාලය)<br><br>(iii) බර ඔසවාගෙන යාම |
| සමබරතාවය | (i) ඉණිමගේ යාම<br><br>(ii) කඹයෙන් බැසීම |

**7. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :**

I. ලිඛිත හා වෘත්තීය පරීක්ෂණය සමත් පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

II. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී මූලික සුදුසුකම් පරීක්ෂා කර බලනු ලබන අතර ලකුණු ලබා දීමක් සිදු නොකරේ.

III. ලිඛිත හා වෘත්තීය පරීක්ෂණය සමත් ව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවන ලද අයදුම්කරුවෙකු/අයදුම්කරුවන් මූලික සුදුසුකම් සපුරා නොමැති බව සම්මුඛ පරීක්ෂණයේ දී අනාවරණය වුවහොත් එම අයදුම්කරුවන් පත්වීම් ලැබීමට නුසුදුස්සන් බවට පත්වන අතර එම නුසුදුස්සන් බවට පත් වන සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් කුසලතා අනුපිළිවෙළට අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

IV. කිසියම් අයදුම්කරුවකු සම්මුඛ පරීක්ෂණයට කැඳවූ පමණින් හෝ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි පමණින් එම අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුස්සෙකු ලෙස සලකනු නොලැබේ.

8. **භාෂා ප්‍රවීණතාවය :**

8.1

| *භාෂාව* | *ලබාගත යුතු ප්‍රවීනතාවය* |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට ආනුෂාංගික චක්‍රලේඛ විධිවිධාන අනුව අදාළ මට්ටමේ අනෙකුත් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |
| සන්ධාන භාෂාව | අදාළ නොවේ. |

9. **සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :**

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) මෙම තනතුරට බඳවා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන රෙගුලාසි හා නියෝගවලටද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලට ද, මොරටුව මහා නගර සභාවේ නාගරික කොමසාරිස් කලින් කල පනවනු ලබන නියමයන්ට හා රෙගුලාසිවලට ද යටත් ව සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

10. **අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :**

(i) අයදුම්පත් **2024.07.05** දිනට හෝ ඊට ප්‍රථම "නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මොරටුව" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "ගිනිහට තනතුර සඳහා බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

(iv) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිළධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

(v) මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම් ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

11. **සාවද්‍ය තොරතුරු සැපයීම :**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍යය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත් ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

12. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීම සම්බන්ධයෙන් ද මෙහි රෙගුලාසි සලසා නොමැති කරුණු පිළිබඳව ද තීරණය ගැනීමේ බලය මොරටුව මහා නගර සභාව සතු වේ.

13. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

එල්. පී. මනෝජා එස්. පතිරණ,
නාගරික කොමසාරිස්,
මොරටුව මහා නගර සභාව.

2024 ජුනි මස 11 වැනි දින.
මොරටුව මහා නගර සභාවේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මොරටුව මහා නගර සභාවේ ගිනිහට තනතුරු සඳහා අයදුම් පත් කැඳවීම

1. මුලකුරු සමඟ නම :.................................................................
2. මුලකුරුවලින් හැඳින්වෙන නම :.................................................................
3. ස්ථිර ලිපිනය :.................................................................
4. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :.................................................................
5. ජාතික හැඳුනුම්පත් අංකය :........................... දුරකථන අංකය :...........................
6. උපන් දිනය : අවුරුද්ද :............... මාසය :............... දිනය :...............
7. ජාතිය :..............................
8. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවුරුදු :............... මාස :............... දින :...............
9. ස්ත්‍රී/පුරුෂ භාවය :.................................................................
10. විවාහක/අවිවාහක බව :.................................................................
11. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචියෙන් ද? :..................................................
12. අධ්‍යාපන සුදුසුකම් :............................................
13. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :............................................
14. වෙනත් සුදුසුකම් :..................................................
15. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම්, ඒ පිළිබඳ විස්තර :

    i. දැනට දරන තනතුර :...........................
    ii. අනියම්/තාවකාලිකව/ආදේශක/කොන්ත්‍රාත් ද යන වග :...........................
    iii. එම තනතුරට පත් වූ දිනය :...........................

16. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේද? :....................................

**අයදුම්කරුගේ ප්‍රකාශය :**

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසුව ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බවද දනිමි.

...........................
අයදුම්කරුගේ අත්සන.

දිනය :..................

දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම ඉල්ලුම්කරු වන ..........................................................................මහතා මෙම ආයතනයේ ..........................................................වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත්, ඔහු කුමන ආකාරයක හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

...........................
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය:...........................
නම :...........................
තනතුර:...........................
නිල මුද්‍රාව:...........................

06-154

# පළාත් පාලන නිවේදන

## නාමල්ඔය ප්‍රාදේශීය සභාව

### නාමල්ඔය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් W/89J කරංගාව ග්‍රාම නිලධාරි වසම සංවර්ධනය වූ ප්‍රදේශයක් බවට ප්‍රසිද්ධ කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134((1) වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති බලතල උපයෝගී කොට ගෙන නාමල්ඔය ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයෙහි දෙසැම්බර් 28 වැනි දින ගන්නා ලද තීරණ අංක 57/2023/12 යටතේ සභාව විසින් සම්මත කරන ලද යෝජනාවට අදාළ පනතේ සඳහන් වගන්තියෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාට ලබා දී ඇති බලතල යටතේ අම්පාර පරිපාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් එස්. එල්. ඒ. කමල් නෙත්මිණි වන මා විසින් අනුමැතිය ලබා දුන් බව මෙයින් මහජනතාවට දනුම් දෙමි.

එස්. එල්. ඒ. කමල් නෙත්මිණි,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
අම්පාර.

**තීරණය**

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වැනි වගන්තිය යටතේ නාමල්ඔය ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති බලතල උපයෝගී කොට ගෙන නාමල්ඔය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි W/89J කරංගාව ග්‍රාම නිලධාරි වසමේ නාමල්ඔය සභාවට අයත් කොටසට මායිම් :

උතුරට - උහන ප්‍රාදේශීය සභා මායිම;
නැගෙනහිරට - අම්පාර නගර සභා මායිම;
දකුණට - අම්පාර නගර සභා මායිම සහ සාමපුර ග්‍රාම නිළධාරි වසමේ නාමල්ඔය ප්‍රාදේශීය සභාවට අයත් කොටසේ උතුරු මායිම;
බටහිරට - උහන ප්‍රාදේශීය සභා මායිම;

ප්‍රදේශ සංවර්ධනය වූ ප්‍රදේශයක් ලෙස පිළිගත යුතු බවත් එසේ පිළිගන්නා යෝජනාවක් ක්‍රියාත්මක කිරීමට අම්පාර පරිපාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබා ගෙන ක්‍රියා කළ යුතු බවත් නාමල් ඔය ප්‍රාදේශීය සභාව තීරණය කරනු ලබයි.

06-144

---

# විවිධ දැන්වීම්

## ඌවපරණගම ප්‍රාදේශීය සභාව

### 2024 වර්ෂය සඳහා ජල ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්ති ප්‍රකාරව මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව 2023.08.31 දිනැති තීරණ පොතේ 136-viii අංක යටතේ ඌවපරණගම ප්‍රාදේශීය සභාවට අදාළව පහත තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එච්. එම්. බිසෝ මැණිකේ,
සභා ලේකම්,
ඌවපරණගම ප්‍රාදේශීය සභාව.

2024 ජුනි මස 14 වැනි දින,
ඌවපරණගම ප්‍රාදේශීය සභාව,
අඹගස්දෝව.

ජල මීටර් නොමැති ස්ථාන සඳහා ජල සැපයුම වෙනුවෙන් වර්ගීකරණය සලකා බලා (ගුරුත්ව/ජල මෝටර්/ජලය මිල දී ගෙන) මසකට ඒකක 10කට සකස් කරන ලද බිල්පත් ගාස්තුවක් ලෙස බිල්පත් අය කිරීම.

- ❖ නව ජල සම්බන්ධතා ලබා දීමේ දී හා/හෝ නමක් මාරු කිරීමේ දී ආරක්ෂිත ඇප තැන්පත් මුදල ලෙස රු. 5,000.00 ක් අය කිරීම.
- ❖ නමක් මාරු කිරීමේ දී හා/හෝ පාරිභෝගික ඉල්ලීම මත තාවකාලිකව විසන්ධි කරන ලද ජල සැපයුමක් නැවත ලබා දීමේ දී සේවා ගාස්තු රු. 1,500.00 ක් අය කිරීම.

- ❖ ජල ගාස්තු නොගෙවීම හා/ජලය අවභාවිතය පදනම් කරගෙන විසන්ධි කරන ලද ජල සැපයුමක් නැවත සන්ධි කිරීමේ ගාස්තුව ලෙස රු. 7,500.00 ක ගාස්තුවක් අය කිරීම.
- ❖ ජල නල එළීම සඳහා මාර්ග පළුදු කිරීමේ ගාස්තුව ලෙස සභාව විසින් ඇස්තමේන්තු කරන ලද සේවා ගාස්තුවක් අය කිරීම.
- ❖ නව ජල සම්බන්ධතා ගාස්තුව ලෙස රු. 15,000.00 ක ගාස්තුවක් අය කිරීම.
- ❖ ජලය අවභාවිතය පදනම් කරගෙන විසන්ධි කරන ලද ජල සැපයුම නැවත සන්ධි කිරීම සඳහා අදාළ දඩ මුදල් හා ගාස්තු ගෙවා අවම වශයෙන් එක් මාසයක්වත් ඉක්ම විය යුතුය.
- ❖ එහි දඩ මුදල් සකස් කිරීම සඳහා පහත සඳහන් නිර්ණායක අනුගමනය කළ යුතු වේ.

I. ජලය ලබා ගත් දින සිට විසන්ධි කළ දිනය දක්වා පාරිභෝජනයට ගෙන ඇති මාසික ජල ඒකක ගණනේ අවමය සහ උපරිමය සලකා බලා එහි මධ්‍යයනය, එකී පාරිභෝගිකයා විසින් අයථා අයුරින් මාසිකව ලබා ගෙන ඇති ජල ප්‍රමාණය ලෙස ගණනය කිරීම.

II. අනතුරුව එක් ජල ඒකකයක් සඳහා අය කරනු ලබන අවම ගාස්තුව පදනම් කර ගනිමින් එසේ මාසිකව අයථා ලෙස ලබාගෙන ඇති ජලය සඳහා අයකර ගත යුතු ගාස්තුව ගණනය කිරීම.

III. එසේ මාසිකව ගණනය කරන ලද මුදල අයථා ලෙස පාරිභෝජනය කර ඇති මාස ගණනින් වැඩිකර දඩ මුදල ගණනය කිරීම.

| | | *රු. ශත* |
|---|---|---|
| * | ප්‍රවර්ධන කටයුත්තක් සඳහා පොදු ස්ථානයක් වෙන් කිරීම | 1,500.00 |
| * | ලුණුවත්ත ක්‍රීඩාපිටිය වෙන් කිරීම | 6,000.00 |
| * | දුරකථන විදුලි සංදේශන කුලුණු මූලික දිග මීටර් 20 ක් සඳහා | 40,000.00 |
| * | වැඩිවන සෑම මීටරයක් සඳහා ම | 1,000.00 |

06-169

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.